ගරු ස්වාමීන්වහන්ස/ මහත්මයාණනි/ මහත්මියණි

## ජාතික පුරාවිද්‍යා සමුළුව - 2022 සඳහා සාරාංශ පත්‍රිකා කැඳවීම

පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන ජාතික පුරාවිද්‍යා සමුළුව 2022 වර්ෂයේ දී ද පැවැත්වීමට මේ වන විට කටයුතු සම්පාදනය කරමින් පවතින බව දන්වා සිටිමි.

ඒ අනුව උක්ත සමුළුව සඳහා පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කිරීමට අපේක්ෂිත ආධුනික හා ප්‍රවීණ පර්යේෂකයින්, විද්වතුන්ගෙන් සාරාංශ පත්‍රිකා (Abstract) කැඳවීම මේ වන විට ආරම්භ කර ඇත. නව පර්යේෂණ යටතේ විෂයානුබද්ධව සකස් කරනු ලබන පර්යේෂණ පත්‍රිකා මෙවර සමුළුව සඳහා අපේක්ෂා කරනු ලබන අතර, ඒ අනුව සකස් කරනු ලැබූ සාරාංශ පත්‍රිකා ඉදිරිපත් කරන ලෙස කාරුණිකව ආරාධනා කර සිටිමු.

- **මාතෘකා - පුරාවිද්‍යාව : කලාව, විද්‍යාව සහ තාක්ෂණය**

- අයදුම් කිරීම සඳහා සුදුසුකම්
  - ✓ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ශාස්ත්‍රීය අංශ නියෝජනය කරන සියලුම නිලධාරීන්
  - ✓ විශ්ව විද්‍යාලවල පුරාවිද්‍යාව හා ඉතිහාසය අධ්‍යයනාංශ, ඉංජිනේරු හා වාස්තු විද්‍යා අධ්‍යයනාංශ, පුරාවිද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ ආචාර්යවරුන්
  - ✓ ජාතික කෞතුකාගාරය, ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව, මධ්‍යම සංස්කෘතික අරමුදල සහ පුරාවිද්‍යා ක්ෂේත්‍රයට සම්බන්ධ ආයතනවල පුරාවිද්‍යා විෂයයට අදාල නිලධාරීන් හා විද්වතුන්
  - ✓ පුරාවිද්‍යාඥයින්ගේ සභාවේ සහ පුරාවිද්‍යා උපදේශක සභාවේ සාමාජිකයින්
  - ✓ පුරාවිද්‍යාව සහ ඒ හා සම්බන්ධිත විෂයයන්ට අදාල උපාධිධාරීන් හා පශ්චාත් උපාධිලාභීන්.
  - ✓ පුරාවිද්‍යා සභාවේ අධිසාමාජිකයින් විසින් සහතික කරනු ලබන දේශන පත්‍රිකා ද සලකා බැලීම සඳහා සුදුසුකම් ලබයි.

- සාරාංශවල කර්තෘත්වය
  - ✓ කර්තෘන් දෙදෙනෙකුට වැඩි ප්‍රමාණයක් කර්තෘත්වය දරණ සාරාංශ හෝ පත්‍රිකා ඉදිරිපත් කිරීමේ දී එක් එක් සම කර්තෘවරයාගේ ශාස්ත්‍රීය විශේෂඥතාව සඳහන් කර එවිය යුතුයි. සාරාංශ පත්‍රිකා පිළිගැනීමේ දී ඒ ඒ කර්තෘවරයාගේ දායකත්වය පත්‍රිකාවෙන් පිළිබිඹුවන ආකාරය වෙත අවධානය යොමු කරනු ලැබේ. එසේ පිළිබිඹු නොවන අවස්ථාවල දී එම සාරාංශ පත්‍රිකා ප්‍රතික්ෂේප වීමට හේතුවක් විය හැක.

- පත්‍රිකා යොමු කළ යුතු ආකාරය
  - ✓ සාරාංශ පත්‍රිකාව වචන 250 කට නොවැඩි විය යුතුය.
  - ✓ A4 කඩදාසියක එක් පසෙක සාරාංශ පත්‍රිකාව එවිය යුතු අතර, අනෙක් පස කර්තෘ / සම කර්තෘන් පිළිබඳ (Profile) එවිය යුතුය.
  - ✓ ඔබ ඉදිරිපත් කරන සාරාංශ පත්‍රිකාව උපරිම මුඛ්‍ය පද (Keywords) 05 කින් දැක්විය යුතුය.
  - ✓ සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයටම අදාලව සාරාංශ පත්‍රිකා ඉදිරිපත් කළ හැක.
  - ✓ එක් අයෙකුට ඉදිරිපත් කළ හැකි උපරිම පත්‍රිකා ප්‍රමාණය දෙකකි (02).
  - ✓ සාරාංශ පත්‍රිකාව සමූහයක් විසින් ඉදිරිපත් කරන විට දී අදාල කණ්ඩායමේ සියලු දෙනා විසින් ඔවුන්ගේ කැමැත්ත සහතික කර එවිය යුතුයි. (එසේ නොවන පත්‍රිකා භාර ගනු නොලැබේ.)

- සාරාංශ පත්‍රිකාව තෝරා ගැනීම සහ භාර ගැනීම

  ✓ සාරාංශ පත්‍රිකා **2022 මාර්තු 31** දිනට හෝ එදිනට ප්‍රථම පහත ලිපිනයට හෝ විද්‍යුත් ලිපිනයට (email) එවීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

  ✓ විද්‍යුත් ලිපිනය (email) - arch.symposium.promo@gmail.com

  ✓ ලිපිනය - වැඩ බලන අධ්‍යක්ෂ (ප්‍රවර්ධන)
  ප්‍රවර්ධන අංශය
  පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
  ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත
  කොළඹ 07

  ✓ ඔබ විසින් සාරාංශ පත්‍රිකාව එවන ලද බව පහත දුරකථන අංකය යටතේ පුරාවිද්‍යා පර්යේෂණ නිලධාරී, දිල්හානි දිල්රුක්ෂිකා මහත්මිය අමතා දන්වන ලෙස වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

  011-2688326 / 011-2665882

- සාරාංශ පත්‍රිකාව තෝරා ගැනීම

  සාරාංශ පත්‍රිකා තෝරා ගැනීම විද්වත් මණ්ඩලයක් මඟින් සිදු වන අතර, තෝරාගත් සාරාංශ පත්‍රිකා වෙනුවෙන් පමණක් පත්‍රිකා කැඳවනු ලැබේ. ඔබගේ සාරාංශ පත්‍රිකාව තෝරාගැනීම පිළිබඳව අවසන් තීරණය ඒ සඳහා පත් කරන විද්වත් මණ්ඩලයේ නිර්දේශ මත පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල් විසින් ගනු ලබයි. 2022 මාර්තු මස ඇතුළත ඔබගේ සාරාංශ පත්‍රිකාව තෝරාගත් බව දැනුම් දීමටත් සම්පූර්ණ පත්‍රිකාව කැඳවීමටත් කටයුතු කරනු ලැබේ. 2022 අප්‍රේල් මස මුල් සතිය වන විට සම්පූර්ණ පත්‍රිකාව කැඳවා අවසන් කිරීමට කටයුතු සැලසුම් කෙරෙන බව ද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි. ජාතික පුරාවිද්‍යා සමුළුව - 2022 පිළිබඳ සියලු වැඩසටහන් හා කාල රාමු මේ වනවිට සකස් කර ඇති අතර, ප්‍රමාද වී ලැබෙන ඉල්ලීම් සලකා බැලීමට හැකියාවක් නොමැති බව කාරුණිකව සලකන්න.

ඒ අනුව ඉහත සඳහන් පරිදි ඔබගේ/ඔබ ආයතනයේ විද්වතුන්/ඔබ ප්‍රාදේශීය පුරාවිද්‍යා කාර්යාලයේ නිලධාරීන් මේ පිළිබඳව දැනුවත් කිරීමට අවශ්‍ය කටයුතු සලසන ලෙස ද වැඩිදුරටත් කාරුණිකව දන්වා සිටිමි.

මහාචාර්ය අනුර මනතුංග
පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්